# බළන්ගොඩ නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීම

2011.01.01 දින සිට 2011.12.31 දින දක්වා බළන්ගොඩ නගර සීමාව තුළ සියළුම මාර්ග වල කසළ එකතු කිරීම, පිරිසිදු කිරීම, ප්‍රවාහනය කිරීම, හා බස් නැවතුම්පල, පොළ භූමිය හා පොදු වෙළඳසැල මනාව පිරිසිදු කිරීමේ සේවාව සඳහා ශ්‍රමිකයන් ලබා ගැනීමේ ලංසු කැඳවීමයි.

බළන්ගොඩ නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා අනුමත කාර්ය මණ්ඩලය පුරප්පාඩු සම්පූර්ණ නොවීම හේතුවෙන් නගරය පවිත්‍ර කිරීම, කැලිකසළ එකතු කිරීම, ඒවා ඉවත් කිරීම ඇතුළුව නගර සභාව විසින් නම් කර ඇති ප්‍රදේශ කරත්ත වලින් කසළ ඉවත් කිරීමේ සේවාව ශ්‍රමිකයන් යොදා පවත්වාගෙන යාම සඳහා 2010 දෙසැම්බර් 22 දින පෙ.ව. 10.00 දක්වා ලංසුපත් භාරගනු ලැබේ.

02. 2010.12.21 වන දින ප.ව. 03.00 දක්වා ලංසු පෝරම නිකුත් කරනු ලබන අතර, කමිටුවේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම ආයතනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කළ යුතුය. වැඩිදුර විස්තර 045-2287275 හෝ 045-2286586 මගින් බළන්ගොඩ නගර සභාවේ නාගරික ලේකම්ගෙන් ලබා ගත හැකිය. ඊට අමතරව www.balangoda.uc.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

03. ලංසු විවෘත කිරීම 2010.12.22 වන දින පෙ.ව. 10.30ට මෙම කාර්යාලයේ දී සිදුකරනු ලබන අතර, මෙම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

| | සේවාවේ ස්වභාවය | ආපසු ගෙවන ලංසු තැම්පත් මුදල රු. ශත | ලංසු පෝරම ගාස්තු | මසකට ඉල්ලුම්කළ යුතු උපරිම ලංසුව රු. ශත |
|---|---|---|---|---|
| I | බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ නිවෙස් වලින් හා වානිජ ස්ථාන වලින් බැහැර කෙරෙන කසළ එක් රැස් කර බැංකියවත්ත සන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කිරීම (මේ සඳහා ට්‍රැක්ටර්, රියදුරු හා ඉන්ධන සපයනු ලැබේ) | 10,000.00 | 1,000 + vat 12% ජා.ගෝ. බදු 3% | රු. 235,000.00 |
| II | නගරයේ මාර්ග පවිත්‍ර කිරීම හා කසළ ඉවත් කිරීම | | | |
| III | පොදු වෙළඳසැළ පවිත්‍ර කිරීම හා කසළ ඉවත් කිරීම | | | |
| IV | බස් නැවතුම්පොල සහිත වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල සහ අවට භූමිය පවිත්‍ර කිරීම හා කසළ ඉවත් කිරීම | | | |
| V | කාපට් කරනු ලැබූ මාර්ග වල වැලි ඉවත් කිරීම | | | |
| VI | මහජන පොල පිරිසිදු කිරීම හා කසළ ඉවත් කිරීම | | | |

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2009 නොවැම්බර් මස 29 වන දින,
බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී.